WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

14 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

| | |
|---|---|
| කතෝලික ධර්මය | I, II |
| கத்தோலிக்கத் திருமறை | I, II |
| Catholicism | I, II |

## කතෝලික ධර්මය II

※ පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව **ප්‍රශ්න පහකට** පිළිතුරු සපයන්න.
※ පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** (i) ශුද්ධ බයිබලයෙහි ප්‍රධාන කර්තෘ සහ උපකර්තෘ නම් කරන්න.
(ii) පුරාණ ගිවිසුමට අනුව යාග පැවැත්වීමේ පරමාර්ථ **දෙක** සඳහන් කරන්න.
(iii) ශුද්ධ වූ මැක්සිමිලියන් කෝල්බේ මුනිතුමා දුටු දර්ශනයේ දේව මාතාවන්ගේ දෑතෙහි තිබුණු සුදු සහ රතු ඔටුනු **දෙකෙහි** අර්ථ දක්වන්න.
(iv) පූදසුන සූදානම් කිරීමේ පිළිවෙතට අයත් අනුකොටස් **දෙක** නම් කරන්න.
(v) කතෝලික සභාව දෙවන වතිකාන මන්ත්‍රණ සභාව මගින් කිතුනු සභා සමඟිය වෙනුවෙන් නිකුත් කර ඇති ප්‍රකාශන **දෙක** මොනවා ද?
(vi) එලොහිම් සම්ප්‍රදායට අයත් සිදුවීම් **දෙක** සඳහන් කරන්න.
(vii) ප්‍රසාද ස්නාපන පොරොන්දු **දෙක** ලියන්න.
(viii) මනස්ථාපනයේ ආකාර **දෙක** සඳහන් කරන්න.
(ix) ක්‍රිස්තුන් වහන්සේගේ දෙවන ආගමනයේ දී මිනිසා අවසාන විනිශ්චයට ලක්වන ප්‍රධාන මිනුම් දඬු **දෙක** මොනවා ද?
(x) යාම යැදුම කරන කණ්ඩායම් **දෙකක්** නම් කරන්න.

**2.** (i) ද්විතීය පාවුලු සංදේශ **දෙක** නම් කරන්න.
(ii) ධර්මදූත චාරිකාවල දී ශුද්ධ වූ පාවුලුතුමාට මුහුණදීමට සිදු වූ අභියෝග **තුනක්** සඳහන් කරන්න.
(iii) ශුද්ධ වූ පාවුලුතුමාගේ ජීවිතයෙන් ඔබට ලබා ගත හැකි ආදර්ශ **පහක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

**3.** (i) ප්‍රධාන දිවැසිවරුන් **දෙදෙනකු** නම් කරන්න.
(ii) දේශක දිවැසිවරුන්ගේ ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න.
(iii) වර්තමාන සමාජයේ දේව වචනයේ පණිවිඩකරුවකු ලෙස දේව වචනය අන් අය අතරට ගෙනයාමට ඔබගේ යෝජනා **පහක්** ඉදිරිපත් කරන්න.

**4.** (i) ස්නාවක ජුවාම්තුමාගේ මවගේ සහ පියාගේ නම් ලියන්න.
(ii) ස්නාවක ජුවාම්තුමා විසින් සාමාන්‍ය ජනතාවට, අයකැමියන්ට සහ භේවායන්ට දුන් අවවාද (පණිවිඩ) **එක** බැගින් වෙන වෙන ම ලියා දක්වන්න.
(iii) ස්නාවක ජුවාම්තුමාගේ පණිවිඩ වර්තමාන සමාජයට කෙතෙක් දුරට ගැළපෙන්නේ දැයි කරුණු **පහකින්** පැහැදිලි කරන්න.

**5.** (i) ජේසුස් වහන්සේ දේව රාජ්‍යයේ වටිනාකම් පිළිබඳ ඉගැන්වූ උපමා **දෙකක්** සඳහන් කරන්න.
(ii) ශුද්ධ වූ මතෙව් සුභාරංචියට අනුව භාග්‍ය **තුනක්** ලියන්න.
(iii) ප්‍රසාද ස්නාපනය තුළින් දිවැසිවරයකු ලෙස කැඳවීම ලද ඔබ, අන්‍යාගමිකයන් ඉදිරියේ දෙවියන් වහන්සේ වෙනුවෙන් සාක්ෂි දරන්නේ කෙසේ දැයි කරුණු **පහක්** ඇසුරෙන් විස්තර කරන්න.

**6.** (i) ප්‍රසාද ස්නාපනයේ දී භාවිත කරන සංකේතාත්මක ද්‍රව්‍ය **දෙකක්** නම් කරන්න.
(ii) ආරම්භක ප්‍රසාද නිධාන **තුන** සඳහන් කරන්න.
(iii) ප්‍රසාද ස්නාපනයෙන් ලැබෙන දේව වරප්‍රසාද කිතුනු සිසුවකු ලෙස ඔබ විසින් ක්‍රියාවට නැංවිය යුත්තේ කෙසේ දැයි කරුණු **පහකින්** පැහැදිලි දෙන්න.

**7.** පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** තෝරා ගෙන, කෙටි සටහන් ලියන්න.
(i) අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත
(ii) ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමාගේ සේවය
(iii) රෝගීන් ආලේපනය කිරීමේ දේව ප්‍රසාද නිධානය
(iv) ශුද්ධ වූ ජපමාලය

※※※

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....